# පානදුර බාලිකා මහා විද්‍යාලය - කළුතර

## වාර අවසාන පරීක්ෂණය 2018 නොවැම්බර්

## 13 ශ්‍රේණිය

**ලංකා ඉතිහාසය** | **25-S-1** | කාලය පැය 3යි

ලංකා ඉතිහාසය(ඈත අතීතයේ සිට ක්‍රි. ව. 1978 දක්වා)
සැලකිය යුතු යි.
* සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

---

ප්‍රශ්න අංක 1-10 තෙක් ප්‍රශ්න වලට නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් මත අනෙක් නම් මත නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැ'යි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

**01** (01) වෙං හෝ (02) ටොලමි (03) කොස්මස් (04) ඔනෙසික්‍රීටස් (05) බැලඩියස් (..........)

**02** (01) බුන්දල (02) පතිරාජවෙල (03) වැල්ලෙගංගොඩ (04) පාහියංගල (05) මිනිහාගල්කන්ද (..........)

**03** (01) කැස්බෑ ලෙලි (02) මුතු (03) වීදුරු (04) අලි ඇතුන් (05) මැණික් (..........)

**04** (01) තල්රුක (02) නුගරුක (03) ඇසතු රුක (04) නෙරළි රුක (05) තෙළඹු රුක (..........)

**05** (01) වල්විදුනාව (02) පාත්‍රා ධාතුව (03) මගුල්කඩුව (04) සේසත (05) මිරිවැඩිසඟල (..........)

**06** (01) ගම්පොළ (02) පොළොන්නරුව (03) දඹදෙණිය (04) යාපහුව (05) කුරුණෑගල (..........)

**07** (01) කැළණි වෙහෙර (02) සිතුල්පව්ව වෙහෙර (03) දෙමටමල් වෙහෙර (04) සඳගිරි වෙහෙර (05) ඉසුරුමුණි වෙහෙර (..........)

**08** (01) ගෝඨාභය (02) උත්තිය (03) යඨාලතිස්ස (04) කාවන්තිස්ස (05) මහානාග (..........)

**09** (01) චේතියා (02) අශෝකමාලා (03) ස්වර්ණමාලි (04) වලවාමුඛි (05) වෙසවුණි (..........)

**10** (01) රජරට (02) දොළොස්දහස් රට (03) රුහුණු රට (04) දක්ඛිණ දේශය (05) මහාමලය දේශය (..........)

අංක 11-15 තෙක් ප්‍රශ්න වල පද යුගල 5 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. ඒ නොගැළපෙන යුගලය කුමක්දැ'යි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**11**
(01) සාලිය - තිස්සා
(02) අභය - චිත්‍රා
(03) දීඝායු - භද්දකච්ඡායනා
(04) විජයබා - මෙත්තා
(05) කාශ්‍යප - උත්පලවණ්ණා (..........)

**12**
(01) ශිව - පාලි
(02) පඬුවස්දෙව් - චිත්‍රා
(03) මහානාම - සංඝා
(04) කාශ්‍යප - බෝධි
(05) කාවන්තිස්ස - ශවෙර (..........)

The National e-learning Portal for The General Education

**13** (01) රක්වාන - රක්ත පාෂාණකණ්ඩක

(02) වාකිරිගල - වල්ලිගාම

(03) ගුත්තල - ගුත්තහාලක

(04) උඳුන්දොර - උද්වනද්වාර

(05) දිඹුලාගල - උම්බරාගිරි (..........)

**14** (01) කතරගම - තිරීතර

(02) සිතුල්පව්ව - නන්දිමිත්‍ර

(03) වැලඑල්ලුගොඩ - ඵුස්සදේව

(04) ජේතවනාරාම ලිපිය- එළාර

(05) රුවන්වැලි සෑ ලිපිය - බුද්දපාරින්ද (..........)

**15** (01) කබර - ශිලාකාර්මික

(02) ලපන - චිත්‍ර ශිල්පී

(03) තුලධර - ස්වර්ණ ශිල්පී

(04) තබකර - තඹ කාර්මික

(05) පෙහෙකර - පේෂකාර්මික (..........)

අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයන්හි නාම/ප්‍රකාශන/ දිනවකවානු සමූහයක් X හා Y තීරු වල දී ඇත. Y තීරුවේ ඇති නාම/ප්‍රකාශන/ දිනවකවානු X තීරුවේ ඇති ඒවා හා කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව X තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළ සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය වරහන තුළ ලියන්න.

**16**

| X | Y |
|---|---|
| (01) සිවිකාසාලා | A ව්‍යාධ දෙවොල |
| (02) සොත්ථි සාලා | B සිව ලිංගය තැබූ ශාලාව |
| (03) වධකස්ථාන | C දඬුවම් දුන් ශාලාව |
| (04) තාල වෘක්ෂ | D වේදය සජ්ඣායනය කළ ශාලාව |
| (05) නීච සුසාන | E පහත් කුලිකයින්ගේ සොහොන |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

**17**

| X | Y |
|---|---|
| (01) පණ්ඩුකාභය | A සිරිනිවාස |
| (02) සීවලී රැජින | B මුරුණ්ඩසිව |
| (03) මුටසිව | C රේවතී |
| (04) මහානාම රජු | D ටිකිරි කුමරු |
| (05) පළමු රාජසිංහ රජු | E පකුණ්ඩක |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

**18**

| X | Y |
|---|---|
| (01) දෙවනපියතිස්ස | A අනුරාධපුර රජ පරපුර |
| (02) යඨාලතිස්ස | B කැළණි රජපරපුර |
| (03) කැළණිතිස්ස | C රුහුණු රජපරපුර |
| (04) චිත්‍රරාජ | D යක්ෂ ගෝත්‍රික පරපුර |
| (05) ගිරිඅබා | E මලය රජ පරපුර |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

**19** X — Y

(01) උපසග්ගරෝගනාස — A වෛද්‍ය හදාළ ශාලාව

(02) පසවන්තිනාමසාලා — B උණ රෝහළ

(03) සිවිකාසාලා — C ශිව ලිංග ශාලාව

(04) සොත්ථිසාලා — D මාතෘ නිවාසය

(05) මහේජ සාලා — E යක්ෂ දේවාලය

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

**20** X — Y

(01) එළාර — A 28

(02) සේන-ගුත්තික — B 14

(03) සත් ද්‍රවිඩ — C 22

(04) ෂට් ද්‍රවිඩ — D 40

(05) මාස — E 44

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**21** ප්‍රාග් බෞද්ධ ඇදහිලි හා විශ්වාස

(01) තිවක්ක පණ්ඩුල තිස්ස වැනි ප්‍රබල බ්‍රාහ්මණයින් සිටිනිසා බ්‍රාහ්මණගම පැවති බව හෙළි වේ

(02) පණ්ඩුකාභය රජු ආජීවකයින් සඳහා ආරාම කරවා ඇත

(03) තල්ගස හා නුග ගස දේව සංකල්පයන් හා සම්බන්ධ කර වන්දනාවට පාත්‍ර කරන ලදී

(04) බෞද්ධ දර්ශනය ප්‍රධාන දර්ශනයක් විය

(05) නැකැත් පිළිබඳ විශ්වාසයක් පැවතුණි (..........)

**22** කාවන්තිස්ස රජතුමා

(01) දුටුගැමුණු රජ චරිතය නිසා ඉතිහාසය තුළ යටපත් වූ චරිතයකි

(02) ලංකාව මුල්වරට එක්සත් කිරීමේ ගෞරවය දුටුගැමුණු රජතුමාට හිමි වුව ද ඒ පිටුපස සිටි යෝධ සෙවණැල්ල කාවන්තිස්ස රජතුමා ය

(03) රුහුණු රජ පරපුරට අයත් ය

(04) අනුරාධපුර රජ පරපුර හා කිසිදු සබඳතාවක් නොතිබුණි

(05) රුහුණ එක්සත් කිරීමේ පුරෝගාමී පාලකයා ය (..........)

**23** කරිකාලන් චෝළ ආක්‍රමණය

(01) වසභ රාජසමයේ එල්ලවිය

(02) ලාංකිකයන්ගේ වාරිතාක්ෂණ දැනුම පිළිබඳ සාකෂියක් ලෙස ද මේ ආක්‍රමණය හැඳින්විය හැකි ය

(03) කාවේරි හා ක්‍රිෂ්ණ නදී අන්තරයේ කෘෂි කටයුතු දියුණු කිරීම උදෙසා මානව සම්පත් උපයාගැනීම මේ ආක්‍රමණයේ අරමුණ වග පැහැදිලි ය

(04) ලාංකිකයන් දොළොස්දහසක් දෙනා මෙහි දී පැහැර ගත් බව සඳහන් වේ

(05) පළමු ගජබා රජු මේ පිරිස නිදහස්කරගෙන ආ බව වංසකතා වල මෙන් ම ජනප්‍රවාදයේ ද සඳහන් වේ (..........)

**24** පැරණි ලංකාවේ වී ගොවිතැන

(01) ඉන්දු ආර්යයන් තිරිඟු හැඳින්වූයේ 'ගෝධූම' යන වදනෙනි

(02) ගෝධූම යන වදනින් ලංකාවේ ගොයම් යන වදන ඇති වී යැයි පිළිගැනේ

(03) පණ්ඩුකාභය කුමර සමයේ වී වගාවේ දියුණුව ගිරිකණ්ඩශිව සම්බන්ධ කතාවෙන් හෙළි වේ

(04) ලංකාවේ වී වගාවට ඉන්දියාවේ මෙන් ගවයින් ගොදාගෙන නැත

(05) ඉන්දියාවේ හින්දු පදනමක් මත සිදුකරන ලද වී වගාව ලංකාවේ බෞද්ධ පදනමක් මත සිදුකරන ලදී (..........)

**25** පස්වන මිහිඳු රජතුමා

(01) දුර්වල පාලකයෙකු ලෙස වංසකතාවල සඳහන් වේ

(02) අනුරාධපුර යුගයේ අවසන් පාලකයා ද වේ

(03) දිවයින පුරා පිහිටි රෝහල් වලට පහසුකම් සැපයූ බව ද වංසකතා වල සඳහන් වේ

(04) අධික ලෙස මත්පැන් පානයට ඇබ්බැහි වී සිටි මේ රජු ලංකාවේ ආර්ථික සංවර්ධනය පිළිබඳ එතරම් උනන්දුවක් නොදැක්වීය

(05) මහා විජයබාහු රජුගේ පියා ය (..........)

අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති(A),(B),(C) හා (D) යන ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය.නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,
(A)සහ(B) පමණක් නිවැරදි නම්............. 1 ද
(B)සහ(C) පමණක් නිවැරදි නම්............. 2 ද
(C)සහ(D) පමණක් නිවැරදි නම්............. 3 ද
(A)සහ(C) පමණක් නිවැරදි නම්............. 4 ද

ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම්............. 5 ද වරහන් තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩණය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A)සහ(B) පමණක් නිවැරදිය. | (B)සහ(C) පමණක් නිවැරදිය. | (C)සහ(D) පමණක් නිවැරදිය. | (A)සහ(C) පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

**26** ලෙන් ලිපි සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) ඉතා කෙටි ලිපි විශේෂයකි

(B) මේ ලිපි ලියා ඇත්තේ පූර්ව බ්‍රාහ්මී අක්ෂරයෙනි

(C) ලංකාවේ වියළි කලාපීය තැනිතලා වලින් පමණක් හමු වේ

(D) ඉතිහාස ගවේෂණයේ දී එතරම් වැදගත් නොවන මූලාශ්‍රයකි (..........)

**27** වල්ලිපුරම් අභිලේඛනය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) ඉසිගිරිය රජ දවසට අයත් වේ

(B) තඹපතක් මත බ්‍රාහ්මී අක්ෂරයෙන් ලි යා තිබේ

(C) රජරට රජුගේ බලය යාපන අර්ධද්වීපයේ ද ක්‍රියාත්මක වූ බවට සාක්ෂියකි

(D) එහි බෞද්ධ විහාරයක් තිබූ බව ද හෙළි වේ (..........)

**28** සීගිරි චිත්‍ර සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) සීගිරියේ පර්වත බිත්තිය මත ඇඳතිබේ

(B) ප්‍රෙස්කෝ ශිල්පක්‍රමයට ඇඳතිබේ

(C) ක්‍රිස්තු වර්ෂ 4-5 සියවස් වල දී ඇඳ තිබේ

(D) ලංකාවෙන් හමුවන පැරණි ම සිතුවම් මේවා ය (..........)

**29** ලංකාවේ අභ්‍යන්තර තැනිතලාව සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) කෘෂි කටයුතු වල දී ඉතා වැදගත් වූ භූමි ඛණ්ඩයකි

(B) තේ හා කෝපි වගාවට ඉතා සුදුසු පරිසරයකි

(C) ලංකාවේ වැව් අතරින් අතිබහුතරය මේ කලාපයේ ස්ථානගත වී තිබේ

(D) ලංකාවේ සියලු ම රාජධානි ස්ථානගතව පැවතියේ මෙහි ය (..........)

The National e-learning Portal for The General Education

**30** ප්‍රාග් ඓතිහාසික ආහාර රටාව සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) සත්ත්වමය ආහාර වැඩි වශයෙන් පරිභෝජනය කළහ

(B) දේශගුණ කලාප අනුව ආහාර රටාව වෙනස් විය

(C) ආහාර සොයා දිනකට කිලෝමීටර 7ක් පමණ ඇවිද ගිය හ

(D) මේ වන විට ජීවගාව ක්‍රමවත් තත්ත්වයට පත්ව තිබුණි (..........)

ප්‍රශ්න අංක 31-35 දක්වා වඩාත් නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉරි මත ලියන්න.

**31** ලාංකිකයන් ක්ෂුද්‍ර ශිලා මෙවලම් තැනීම ආරම්භ කරන්නේ

(01) ප්ලයිස්ටොසීන අවධියේ දී ය

(02) හොලොසීන යුගයේ දී ය

(03) පූර්ව ඓතිහාසික සමයේ දී ය

(04) මුල් ඓතිහාසික යුගයේ දී ය

(05) මුල් නාගරීකරණ අවධියේ දී ය (..........)

**32** අනුරාධපුර නගර ප්‍රාකාරය රියන් 18ක් පමණ උස් කොට බඳවා සවිමත් දොරටු හා මුර අටලු ආදියෙන් ආරක්ෂිත නගරයක් බවට පත් කළේ

(01) පණ්ඩුකාභය රජු

(02) කුටකණ්ණතිස්ස රජු

(03) වසභ රජු

(04) මහසෙන් රජු

(05) ධාතුසේන රජු (..........)

**33** රෝහණයේ බලය තහවුරුකර ගැනීම උදෙසා දසභාතිකවරුන් ඝාතනය කිරීම නිසා මහජන අප්‍රසාදයට ලක් වූ පාලකයා

(01) මහානාග රජු

(02) යඨාලතිස්ස රජු

(03) ගෝඨාභය රජු

(04) කාවන්තිස්ස රජු

(05) දුටුගැමුණු රජු (..........)

**34** ෂට් ද්‍රවිඩයන් ලංකාව ආක්‍රමණය කළ සමයේ ලංකාවේ පාලකයා වූ මිත්සෙන් රජු

(01) මහානාම රජුගේ අන්‍ය බිසවකගේ පුතෙකි

(02) කැරලිකාර සොරෙකි(කරල් සොරු)

(03) අමාත්‍යවරයෙකි

(04) දොරටු පාලකයෙකි

(05) ඡත්තග්ගාහකයෙකි (..........)

**35** රෝහණය එක්සත් කිරීමේ කාර්යයේ දී මහා විජයබාහු රජුට සතුරුව කටයුතු කළ නායකයෙකි

(01) කේශධාතු කාශ්‍යප

(02) සිත්නරුබිම් බුදල්නා(බුද්ධරාජ)

(03) මහාසාමි මුගලන්

(04) වික්‍රමබාහු

(05) ජයබාහු (..........)

36 සිට 40 තෙක් ප්‍රශ්න යටතේ ප්‍රකාශ 2 බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ගැළපෙනුයේ පහත වගුවේ දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | නිවැරදිය |
| 2 | නිවැරදිය | වැරදිය |
| 3 | වැරදිය | නිවැරදිය |
| 4 | වැරදිය | වැරදිය |
| 5 | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| **36** | ස්ථිරවාසී භාවය ඇරඹීමේ මුල් පදනම ලෙස අවිධිමත් කෘෂිකර්මය ආරම්භ විය. | ක්‍රමවත් සුසාන ක්‍රම ඇරඹෙන්නේ පූර්ව ඓතිහාසික අවධියේ ය. | (..........) |
| **37** | මහානාග යුවරජු අනුරාධපුරයෙන් නික්මී රුහුණට යනවිටත් එහි ප්‍රාදේශීය රාජධානි කිහිපයක් ම තිබුණි. | යඨාලතිස්ස රජු රුහුණ එක්සත් කිරීම් පියවරක් ලෙස සේරු නුවර චෛත්‍යය ඉදිකිරීමට අවසර පතා තිබුණි. | (..........) |
| **38** | කාශ්‍යප කුමරා ධාතුසේන රජුගේ අන්තඃපුර බිසවකගේ පුත්‍රයෙකු වූ නිසා රජකමට නීත්‍යානුකූල උරුමකරුවෙකු නොවී ය. | මුගලන් කුමරු කාශ්‍යපට විරුද්ධව ඉන්දීය යුධාධාර පැතුවේ ය. | (..........) |
| **39** | පස්වන මිහිඳු රජ දවස ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු ලංකාව ආක්‍රමණය කළේ ය | ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු ලංකා පාලකයා සිරකරුවෙකු ලෙස චෝල්ලෝරයට රැගෙන ගියේ ය. | (..........) |
| **40** | අනුරාධපුර යුගයේ අග ලංකාවේ විදෙස් සබඳතා වලට වඩා පොළොන්නරු යුගයේ විදෙස් සබඳතා යහපත් තත්ත්වයේ පැවතුණි. | විදෙස් සබඳතා පැවත්වීමේ දී මහා විජයබාහු රජු අනුගමනය කළ ක්‍රියාමාර්ග නිසා බුරුමය හා ලංකාව අතර හොඳහිත පළුදු විය. | (..........) |